ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි යොමු අංකය: 1920-010.1

2019 ඔක්තෝබර් 20

දයාබර දෙමව්පියන් වෙත,

<u>නව ආරක්ෂක වැඩපිළිවෙල සම්බන්ධයෙන් කෙරෙන දැණුම් දීමයි</u>

පසුගිය මහා සභා රැස්වීමේදී ප්‍රකාශයට පත් කෙරුණු පහත සඳහන් නව ආරක්ෂක වැඩපිළිවෙල 2019 ඔක්තෝම්බර් 25 වන දින සිට කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රයේදී ක්‍රියාත්මක වන බව ගරු කොන්සල් ජනරාල්තුමන් විසින් අප හට දැනුම් දී ඇත.

<u>ආරක්ෂක වැඩපිළිවෙල:</u>

1. ආරක්ෂක නිලධාරීන් යොදවා කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රයට පැමිණෙන සියලු දෙනා පරික්ෂාවට ලක් කිරීම.
2. එහිදී පැමිණෙන අය ලියාපදිංචි කිරීම සහ තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීම.
3. පරික්ෂක උපකරණ (metal director) යොදා ගෙන ගමන් මළු පරික්ෂා කිරීම.

දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කෙරෙන මෙම නව වැඩපිළිවෙල සාර්ථකව පවත්වාගෙන යාම සඳහා දහම් පාසැල සහ දෙමාපියන් වශයෙන් උපරිම සහාය ලබා දිය යුතු බව අවධාරණය කරන අතර පහත සඳහන් කරුණු වැඩිදුර අවධානයට ලක් කරමු.

ඉහත ආරක්ෂක වැඩපිළිවෙල යටතේ ප්‍රධාන දොරටුව අසල මුර කුටියක් පිහිටුවා පුද්ගලික ආරක්ෂක සේවයක් මගින් පැමිණෙන අය පරික්ෂා කිරීම සහ ලියාපදිංචි කර තාවකාලික අවසර පත්‍රයක් ලබාදීම කෙරෙනු ඇත. එනමුදු, දහම් පාසලේ දෙමාපියන් හට අප විසින් ලබාදෙන හැඳුනුම් පත්‍රය දහම් පාසැල තුලට පැමිණීම සඳහා වන අවසර පත්‍රයක් බවට පත් කර, ලියාපදිංචියකින් තොරව කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රයට ඇතුල් වීමට හැකි වනු ඇත. එසේ වුවද, දොරටුව අසළ තදබදය අවම කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ:

- දොරටුව අසලින් දරුවන් ඇතුල් කර දෙමාපියන් ආපසු යා යුතු අතර දහම් පාසලේ කටයුතු සඳහා දායක වන දෙමාපියන් පමණක් ශාලාව තුලට පැමිණීම කල යුතු වේ. පාසැල අවසන්ව දරුවන් රැගෙන යාමට පැමිණෙන දෙමාපියන් සුපුරුදු පරිදි කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රය තුලට පැමිණ දරුවා භාරගත යුතුය. ඒ සඳහා තම දහම් පාසල් හැඳුනුම්පත පැළඳ සිටීම අනිවාර්ය වනු ඇත.
- උදෑසන වරුවේ පාසලේ අධ්‍යයන කටයුතු පෙ.ව.11:50 ට අවසන් කරන බැවින් දරුවන් රැගෙන යාමට පැමිණෙන දෙමාපියන් 12:15 ට පෙර දරුවන් රැගෙන යාම කල යුතු වේ.
- දහම් පාසල් සැසිවාර දෙක අතර ඇතිවන තදබදය අවම කිරීම සඳහා දහවල් වරුවේ පාසල් ආරම්භය විනාඩි 15 කින් ඉදිරියට ගෙන ගිය අතර ඒ අනුව දහවල් සැසිවාරය 12:45 ට ආරම්භ කෙරෙනු ඇත. එම නිසා දහවල් වරුවේ දරුවන් රැගෙන එන දෙමාපියන් 12:20 සිට පමණක් පාසලට පැමිණිය යුතු වනු ඇත.
- එම අවස්ථාවේදීද, පළමුවන පන්තියේ දරුවන් රැගෙන එන දෙමාපියන් පමණක් දරුවන් සමග පාසැල තුළට පැමිණීමට අවසර ලැබෙන අතර 2 සහ 3 පන්තිවල දරුවන් ප්‍රධාන දොරටුවෙන් ඇතුල් කර දෙමාපියන් පිටත්ව යා යුතු වනු ඇත.
- පළමු පන්තියේ දරුවන්හට පාසල හුරු පුරුදු වන තෙක් එම දෙමාපියන්හට පාසලට ඇතුල්වී පන්තියට දරුවා රැගෙන යාම කල හැකි අතර, මාස දෙකකින් පමණ දරුවන් හුරු පුරුදු වූ පසු එම දෙමාපියන්ටත් ප්‍රධාන දොරටුව අසලින් දරුවා ඇතුල් කිරීමෙන් පසුව පිටත් ව යාම කල යුතු වනු ඇත.
- අනෙකුත් පන්තිවල දරුවන් ප්‍රධාන දොරටුවේ සිට පන්ති කාමරය දක්වා දරුවා රැගෙන යාම දෙමාපිය කමිටුවේ සාමාජිකයන් විසින් සිදු කරනු ඇත.

ඉහත සඳහන් පරිදි දෙමාපිය හැඳුනුම්පත් සඳහා මවගේ සහ පියාගේ ඡායාරූප <u>2018 ඔක්තෝම්බර් 31</u> දිනට පෙර අපවෙත එවීමට අප දහම් පාසලේ වෙබ් අඩවියට පිවිස එහි සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් කරුණාවෙන්

ඉල්ලා සිටිමු. මේ සඳහා පහත දිගුව ද (https://forms.gle/hHbnqzAaUGSxVjXW9) භාවිතා කල හැක. මෙලෙස පිළියෙළ කරන හැඳුනුම්පතෙහි දරුවාගේ සහ දෙමාපියන්ගේ චායාරූපයද අඩංගු වන අතර දොරටුවේදී හැඳුනුම් පත් පරීක්ෂාවට ලක්වෙන නිසා එය පැළඳගෙන සිටීම අනිවාර්ය අවශ්‍යතාවයක් වෙනු ඇත. මේ සඳහා වන වියදම් සඳහා වන මුදල දෙමාපිය කමිටුව වෙත ලබාදී හැඳුනුම්පත් ලබා ගන්නා මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

හැඳුනුම්පත නොපැළඳීමෙන් ඔබ, අප සහ ආරක්ෂක නිලධාරීන් අපහසුතාවයකට පත් වන අතර, එසේ නොවනසේ හැඳුනුම්පත පැළඳ ඒමට ඔබ සැම කාරුණික වන මෙන් අවධාරණය කර සිටිමු. <u>යම් හෙයකින් හැඳුනුම්පත රැගෙන ඒමට නොහැකි වුවහොත්, හැඳුනුම් පත් ඇති දරුවන් දෙමාපියන් ආරක්ෂක කටයුතු නිමවා ගිය පසු ආරක්ෂක නිලධාරීන් ලියාපදිංචියෙන් පසු ලබාදෙන තාවකාලික හැඳුනුම්පතක් ලබාගෙන පැමිණීමට සිදුවෙනු ඇත</u>.

මොනයම් හේතුවක් මත පොලිසිය කැඳවීම අවශ්‍ය වුවහොත් ඒ සඳහා ක්‍රියා කිරීම කොන්සල් ජනරාල්තුමන් හෝ ඒ සඳහා පත්කරන ලද කොන්සල් ජනරාල් කාර්යාල නිලධාරියෙක් විසින් සිදු කෙරෙනු ඇත. ඔවුන්ට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට සම්පූර්ණ සහාය ලබා දීම අප සැමගේ යුතුකමක් සහ වගකීමක් වනු ඇත.

මෙම ආරක්ෂක වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා දහම් පාසලේ සහයෝගය ගරු කොන්සල් ජනරාල්තුමන් හට සහ එම නිලධාරීන් හට අනිවාර්යෙන්ම ලබා දිය යුතු වනු ඇත. අපේ දරුවන් ගේ ආරක්ෂාව මේ මගින් තහවුරු වන බැවින් මෙම වැඩපිළිවෙල දහම් පාසැලේ කටයුතු සාමාන්‍ය ලෙස පවත්වාගෙන යාමට හැකිවනු ඇත.

ස්තූතියි

සංවිධායක මණ්ඩලය, ඩුබායි දහම් පාසල
http://www.dhahampasala.org/